# 12 පද බෙදීම

පැහැදිලි හා නිවැරදි අදහස් සන්නිවේදනයට මග පෑදෙන්නේ නිසිතැන - නිසි ලෙස, සම්මත රීතීන්ට අනුකූල ව පද බෙදා බස හැසිරවීමෙනි. මේ පාඩම ඉගෙනීමෙන් ඔබට ලේඛන ව්‍යවහාරයේ පද බෙදීම සම්බන්ධ ව පවතින සම්මත රීති කිහිපයක් අවබෝධ කර ගැනුමට හැකිවනු ඇත.

## පලාලි ගමන

''බ්රූම්........... ම්.......... බ්රූම්...... බ්රූම්...... ම්...... ම්.....!
''පීප්.......... පීප්........ පීප්.........!''

මහ හඬ නංවමින් පැමිණි පුංචි සිරිමල්ගේ වාහනය කළු මැණිකා නැන්දාගේ දොරකඩ නතර විය.

''කළු නැන්දේ......, කළු නැන්දේ......!''
''ඇයි සිරිමල් පුතේ.......?''

කුස්සියේ දර ලිප මත තිබුණු බත් මුට්ටිය ඇර බලමින් ම කළුමැණිකා ඇසුවා ය.

''අම්මා කිව්වා, පලාලි යන්න ලෑස්ති වෙලා ඉන්නේ කියලා, නැන්දාටත් පුළුවන් ඉක්මනින් අපේ ගෙදරට එන්න කියලා........''

''මොනවා ! මේ හදිස්සියෙ? කාරණේ මොකක්ද කියලා කිව්වේ නැද්ද පුතේ....?

''නෑ නැන්දේ, අපි කට්ටිය වෙල් ඉපනැල්ලේ සෙල්ලම් කර කර හිටියේ, අම්මා තමයි මට කතා කරලා ඔය පණිවිඩය නැන්දාට කියන්න කීවෙ..... ඕං මං ගියා..... බ්රූම්..... බ්රූම්..... ම්..... ම්..... පී..... පී..... පී.....''

පුංචි සිරිමල් පැමිණි වේගයෙන්ම නැවතත් වෙල් ඉපනැල්ල දෙසට ඉගිළ ගියේ ය.

''අම්මේ, මොකද දන්නෙ නෑ මේ හදිස්සියෙම පලාලි යන්න එන්න කියලා ලොකු නැන්දා අම්මට පණිවිඩ එවලා තියෙන්නෙ, මොකක් නමුත් ලොකු කරදරයක් වගේ.....! අම්මා ඉක්මනට ලෑස්තිවෙලා යන්න, මම මේ වැඩ අහවර කරන්නම්'යි කියමින් කළුමැණිකාගේ ලොකු දුව කුස්සියට ඇතුළු වූවාය.

''අනේ! ඒක නේන්නම් දුවේ, ලොකු නැන්දගෙ මද්දුම පුතා, සෝමරත්නත් ඔය පලාලි පැත්තෙ යුද්ධ කඳවුරක නේද පහුගිය දවස්වල හිටියෙ? යුද්ධෙත් ඇවිලිලා යන මේ වෙලාවෙ පුතාටවත් මොකක්වත් කරදරයක් වත්ද, අනේ එහෙම විපතක් නම් වෙන්න එපා ! මද්දු පුතාට දළදා හාමුදුරුවන්ගෙ රැකවරණයි.....! තිස්තුන් කෝටියක් දෙවි දේවතාවුන්නාන්සේලාගේ පිහිට යි ! ආරක්සාවයි !''

කළුමැණිකා එසේ කියමින් ම ලකලෑස්තිවී ගෙයි කඩුල්ල පැන අඩියට දෙකට පුංචි සිරිමල්ගේ ගේ දෙසට ගියා ය.

''ලොකු අක්කේ, ලොකු අක්කේ,..... කෝ මේ ගෙදර ඇත්තෝ? ඕං මං නම් විනාඩියට ලෑස්තිවෙලා ආවා. හැබෑවටම මොකක්ද සිද්ධවෙලා තියෙන්නෙ කිව්වානම්..........? ''

මෙසේ කියමින් ගෙට ඇතුළුවන කළුමැණිකා දෙස බලා,

''මොකද කළු නංගියෙ මේ? බැහැරක ගිහින් එන ගමන් ද? යි සිරිමල්ගේ මව ඇසුවේ විස්මයෙනි.

''ඇයි ලොකු අක්කෙ? දූන් අක්කම නේද මට පලාලි යන්න ලෑස්තිවෙලා එන්න කීවෙ? '' කළුමැණිකා ඇසුවා ය.

''පලාලි යන්න? මට පේන්නේ කළු නංගිට පොඩි පටලැවිල්ලක් වෙලා වගේ.....! ''

''පටලැවිල්ලක්.....? ''

''ඔව්, ඇයි නංගියෙ? ගිය සුමානෙ උඩ ලියැද්දෙ ගොයම් කපන වෙලාවෙ මං කිව්වා මතක නැද්ද? නුග පිටියෙ වැඩිහිටි නිවාසෙට දානයක් බාර ගත්තා කියලා, මං මේ දානෙ ලෑස්ති කරන ගමන්.....! ''

''ඔව්..... ඔව්..... කිව්වා නේන්නම්, ඉතින් ඒකෙයි මේකෙයි තියෙන සම්බන්ධෙ මොකක්ද ලොකු අක්කෙ.....?''

''කළු නංගි ඉතින්, පලා ජාති ලියන්න කවදත් හපනා හින්දා මං මේ පලා ටික ලෑස්ති කරලා, ඒ ටික ලියවගන්නයි නංගිට සිරිමල් පුතා අතේ පණිවිඩ ඇරියෙ...... හනිකට එන්න කියලා, දානේ ලෑස්ති කරන්න පමා වෙන හින්දා.....

''අනේ ඇත්තට.........? මේ සිරිමල් පුතා 'පලාලි යන්න' එන්නයි කියලා කියාපු හදිසියත්, විලාසයත් හින්දා මට තේරුණේ වෙනත් විදියකටනේ අක්කෙ'යි කළුමැණිකා මදක් ලැජ්ජාවෙන් පවසද්දී, සිරිමල්ගේ මව මුවගට නැගුණු සිනාව යටපත් කරගත්තේ බොහෝ අසීරුවෙනි.......

★ ★ ★ ★ ★ ★

අදහසක් වැරදි ලෙස සන්නිවේදනය වීමෙන් අපට අත් විඳීමට සිදුවන දුෂ්කරතා බොහෝ ය. යට කියන ලද කථාවෙන් පළකෙරෙන අත්දැකීම ද එබන්දකි.

භාෂණයේ දී වේවා, ලේඛනයේ දී වේවා, නිසිතැන, නිසි ලෙස පද බෙදා, විරාම තබමින් භාෂාව පරිහරණය නොකළහොත් සන්නිවේදනය වන්නේ වැරදි අදහසකි.

නමුත්, කථනයේ දී ඇතිවිය හැකි දුරවබෝධයන් මග හරවා ගැනීම එතරම් අපහසු නොවුණත්, ලේඛනයේ දී වැරදි අදහස් සන්නිවේදනය වීම නිසා අපේක්ෂිත අරමුණු ඉටු නොවනවාසේ ම ගැටලුකාරී තත්ත්වයන් ද පැන නැගිය හැකි ය.

පහත නිදසුන බලන්න :-

**ජාති යට ඇස් කණ් ණාඩි සප යන්නෝ,**
**තාර කා දෘෂ්ටි විශේෂඥයෝ.**

මෙම දැන්වීමෙන් පළ කෙරෙන අදහස ව්‍යාකූලය. ඊට හේතුව වැරදි පද බෙදීමයි. මෙම දැන්වීම ම නිවැරදි ලෙස පද බෙදා ලියා දැක්වුවහොත් ඉන් පළ කෙරෙන අදහස නිරවුල් ය. පැහැදිලි ය. පහත නිදසුන බලන්න.

**ජාතියට ඇස්කණ්ණාඩි සපයන්නෝ,**
**තාරකා දෘෂ්ටි විශේෂඥයෝ**

මෙලෙස ලේඛනයේ දී නිවැරදි අදහස් සන්නිවේදනය සඳහා ඉවහල් වන කරුණු රැසකි.

- ★ නිවැරදි අක්ෂර වින්‍යාසය
- ★ නිවැරදි විරාම ලක්ෂණ භාවිතය
- ★ නිවැරදි පද බෙදීම

යන කරුණු ඉන් ප්‍රධාන වේ.

මෙහි දී අපගේ අවධානය යොමු වන්නේ පද බෙදීම කෙරෙහි ය. නිවැරදි පද බෙදීමක් සඳහා අනුගමනය කළ යුතු නියමයන් කිහිපයක් මතු දැක්වේ. ඒවා හොඳින් ඉගෙන, ලේඛනයේ දී භාවිත කිරීමෙන් ඔබටත් නිවැරදි අදහස් සන්නිවේදනය වඩාත් පහසු වනු ඇත.

**1. නාමපද, ක්‍රියාපද, නිපාත පද, වෙන්කොට ලියනු ලැබේ.**

උදා :- මේ මහලු මිනිසා දරුවකු ව සිටිය දී ගත කළේ ඉතා දුක්ඛිත ජීවිතයකි.

| නාමපද | ක්‍රියාපද | නිපාත පද |
|---|---|---|
| මහලු මිනිසා | ගත කළේ | ව |
| දරුවකු | සිටිය | දී |

**2. උපසර්ග පද වෙන් නො කෙරේ.**

උදා :- අනුනායක හිමියෝ අවමඟුලට සහභාගී වූහ.

<u>උපසර්ග</u>

<u>අනු</u>නායක
<u>අව</u>මඟුලට

**3. සන්ධි පද තනි පදයක් ලෙස එක්කොට ලියනු ලැබේ.**

උදා :- අත්තම් නිවාස පේලියේ කෙළවරෙහි ම තිබුණේ කම්මලකි.

<u>සන්ධි පද</u>

අත් + කම් = අත්තම්
කම් + හල = කම්මල

**4. සමාස වූ පද එක් පදයක් ලෙස ලියනු ලැබේ.**

උදා :- ''පරසතු මලින් පුද
ලද මුනි සඳුට දියනඳ
වනපස මලින් පුද
කළැයි පවසනු කවර වරදද?''

<u>සමාස පද</u>

දියනඳ
වනපස

**5. විභක්ති ප්‍රත්‍යය මුල් පදය හා එක්කොට ම ලියනු ලැබේ.**

උදා :- වට වැස්සෙන් වැව් උතුරා ගියේ ය.
බල්ලන්ගෙන් ප්‍රවේශම් වන්න.!
දුප්පතුන්ගේ දුක දකින්නෝ කවරහු ද?

<u>විභක්ති පද</u>

බල්ලන්ගෙන්
වැස්සෙන්
දුප්පතුන්ගේ

6. **ගෞරවාර්ථය දීම සඳහා යෙදෙන වහන්සේ, සේක, දෑ ආදී පද වෙන්කොට ලිවිය යුතු ය.**

උදා :- තෙරුන් වහන්සේ පිඬු සිඟා වැඩි <u>සේක</u>.
පියාණන් දෑ පුතුට ඔවදන් දුන් <u>දෑ</u> ය.

## ක්‍රියාකාරකම 12.1

පහත දැක්වෙන වැකි නිසි ලෙස පද බෙදා නැවත ලියන්න.

1. මහා ශබ්ද යක් නං වමින් බෝ්ම් බය පුපු රා ගියේය.
2. පොලිස්නිල ධාරීහු සොරා අල්ලා ගෙන අධිකර ණයට ඉදිරි පත්කළහ.
3. බැහැයි කිව්වනම් මං ගේය තුල්ලල යන වනේද?
4. අන්ද රේකැටුව දිනක් රජජුරුවෝ මා වැලිගඟ බඩ ඇවි දීමට ගියෝය.
5. මෙක්සි කෝ්ව ඇමෙරි කා එක් සත් ජන පද යටද කුණින් පිහි ටිර ටකි.

## ක්‍රියාකාරකම 12.2

වැරදි ලෙස පද බෙදා කීමෙන් හෝ ලිවීමෙන් මුහුණ දීමට සිදුවු තත්ත්වයන් පිළිබඳ අත්දැකීම් ඔබටත් තිබෙන්නට පුළුවන. ඒවා පන්තියේ අන් අය සමග සාකච්ඡා කරන්න.

## ක්‍රියාකාරකම 12.3

පහත දැක්වෙන ඡේදය පද වෙන්කොට නැවත ලියන්න.

ඒසිටුපුත්තෙමේබරණැසඅසූකෙළක්වස්තුඇතිසිටුකුලයකඋපන.උන්ගේ දෙමවුපියෝඅපගේසම්පතමහත.අපගේපුතණුවන්කැමතිපමණකටඇත.

සෙස්සහැයිද්‍ ’යිවිද්දත්කුලයකඋපන්නාසේගීනැටීම්පමණක්ඉගැන්වූහ. එමනුවරඅසූ කෙළක්වස්තුඇතිකුලයකදුවණිකෙනෙකුන්උපන්නාහ.උන්ගේදෙමවුපියෝත්අරමුන්ගේ දෙමවුපියන්සිතූලෙසටමසිතාඋනුත්ගීනැටීම්පමණක් ඉගැන්වූහ.වැඩිවියපැමිණියවුන් ඔවුනොවුන්ටමනිලකළහ.

## ixl ,amkd

**මුහුණ දෙන සෑම දෙයක් ම වෙනස් කළ හැකි ය. එහෙත් මුහුණ දෙනතුරු කිසිවක් වෙනස් කළ නොහැකි ය.**